## මත්පැන් සඳහා බලපත්‍ර ලබා ගැනීම.

**සුදුසුකම්**

**ස්ථානයේ පිහිටීම සම්බන්ධව ඇති සුදුසුකම්**

මත්පැන් විකිණීම සඳහා අඩුම තරමින් ව.අඩි. 250 ක බිම් කොටසක් තිබීම පරිභෝජනය සඳහා මත්පැන් විකිණීමේදී එහි ඉඩකඩ අඩුම තරමින් වර්ග අඩි 500 ක් තිබිය යුතුය.

සැලකිය යුතුයි
සිල්ලරට මත්පැන් (බියර්, ස්ටවුට්, වයින්) විකිණීම සඳහා බලපත් ලබා ගැනීමේදී මෙය අදාළ නොවේ.

**මත්පැන් විකිණීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේදී**

- මත්පැන් හලේදී පරිභෝජනය නොකරන්නේනම් - පාසල් ප්‍රසිද්ධ ස්ථාන පූජනීය ස්ථාන වැනි තැන් වලින් මීටර 100 ටවත් දුරින් මත්පැන් හල් පිහිටිය යුතුය.
- මත්පැන් හලේදීම පරිභෝජනය කිරීමේදී - පාසල් ප්‍රසිද්ධ ස්ථාන පූජනීය ස්ථාන වැනි තැන් වලින් මීටර 500 ටවත් දුරින් මත්පැන් හල් පිහිටිය යුතුය.

සැලකිය යුතුයි.

අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක් පවත්වාගෙන යනු ලබන මත්පැන් හල සම්බන්ධව ඉහත සඳහන් කරුනු අදාල නොවේ. එම ඉල්ලුම්පත නිකුත් කිරීම සුරාබදු කොමසාරිස් මගින් සිදුවේ. එහි ඉඩකඩ පිළිබඳව සුරාබදු කොමසාරිස් තුමා සෑහීමකට පත්වේ නම් හා මත්පැන් විකිණීම සම්බන්ධව පොදු ජනයාගේ විරුද්ධත්වයක් නොමැති නම් බලපත්‍රය නිකුත් කෙරේ.

පූජනීය ස්ථාන පාසල් වැනි තැන් අදාල මත්පැන් හල ඉදිවීමට පසුව ඉදිවුනේ නම් හා ඒ පිළිබඳව සුරාබදු කොමසාරිස් තුමා සෑහීමකට පත්වේ නම් ඉහත කරුණු අදාල නොවේ.

ඉහත සඳහන් තොරතුරු පහත සඳහන් කරුණු සම්බන්ධව අදාළ නොවේ.

බලපත්‍ර නිකුත් කර ඇත්තේ සංචාරක මණ්ඩලය මගින් අනුමත කරන ලද හොටල් අවන්හල් සඳහා නම්, බලපත්‍ර නිකුත් කර ඇත්තේ සමාජ ශාලා වැනි මත්පැන් පමණක් අලෙවි කරන ස්ථානයක් සඳහා නොවන්නේ නම් සුරාබදු කොමසාරිස් තුමා එම ස්ථාන ගැන සොයා බලනු ලැබේ.

**ඉල්ලුම් කරුගේ සුදුසුකම්**

- බලපත්‍රයක් ලබා ඇති පුද්ගලයෙකුට දෙවන බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ දිස්ත්‍රික්කය තුළ වෙනත් සුදුසු ඉල්ලුම් කරුවෙකු නොමැති අවස්ථාවකදීය.
- සටහන් සුරාබදු කොමසාරිස් තුමා විසින් එකම දිස්ත්‍රික්කය තුළ එක් තැනැත්තකුට බලපත්‍ර දෙකක් නිකුත් කරනු නොලබන්නේ තනි අයිතිය හා එමගින් නොයෙකුත් කරදර හා බාධා ඇති වේ යැයි අදහස් කරන හේතුන් මතය.

**බලපත්‍රය අවලංගු වීම**

වෙළඳ සල් / පූජනීය ස්ථානවලට බල පාන අයුරින් මත්පැන් හල් සම්බන්ධයෙන් යම්කිසි පීඩාකාරී සිදු වීමක් පිළිබඳව යම් කිසිවකු විසින් චෝදනාවක් නැගූ අවස්ථාවක රජයේ මිනින්දොරු නිලධාරියකු ලවා

නිරීක්ෂණය කරනු ලබයි. සමීක්ෂණය සඳහා ගෙවීම් බලපත්‍ර හිමිකරු විසින් ගෙවිය යුතුය. දුර පිළිබඳ ගිවිසුම උල්ලංඝනය කර තිබුනහොත් බලපත්‍රය අවලංගු වේ.

- බලපත්‍රය නිකුත් කිරීමට පෙර හෝ පසු ඉල්ලුම්කරු විසින් ගිවිසුම උල්ලංඝනය කිරීමක් පිළිබඳව සංවිධානයේ තැනැත්තකු විසින් හෝ ප්‍රදේශවාසියකු විසින් කරනු ලබන විරුද්ධත්වයක් හෝ යම්කිසි අවලංගුතාවක් හෝ අවස්ථාවකට එකඟ නොවේ නම් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රතිපත්ති හා කොන්දේසි මත බලපත්‍රයෙහි පැවැත්ම හෝ පවත්වාගෙන යැමේ කාලය පිළිබඳව ප්‍රධාන සුරා බදු කොමසාරිස් තුමා විසින් ඉල්ලුම්කරුට දැනුම් දීම හෝ පැමිණිල්ල පිළිබඳ වලංගු කාලසීමාව පිළිබඳ විභාග කිරීමෙන් පසු තීන්දුවක් ගනු ලැබේ.

**ඉදිරිපත් කිරීමේ ක්‍රියා මාර්ගය**

**01. ඉල්ලුම්පත්‍රයක් ලබා ගැනීම**

- ඉල්ලුම්කරු ඉල්ලුම් පත්‍රයක් ලබා ගත යුත්තේ සුරාබදු මූලස්ථාන කාර්යාලයෙන් හෝ දිවයින තුළ ඇති සහකාර සුරාබදු කාර්යාලයෙන් ඉල්ලුම්පත් මුදල ගෙවීමෙනි.
- අවශ්‍ය ලියකියවිලි සහිතව සෑම අංශයකින්ම ඉල්ලුම්පත සම්පූර්ණ විය යුතුය.

**02. අවශ්‍ය කරන අදාළ ලියකියවිලි**

අ) ප්‍රාදේශීය අධිකාරිය මගින් සහතික කරනු ලැබූ යෝජිත ගොඩනැගිල්ලේ සැලැස්මේ පිටපතක්.
ආ) ඔප්පුව සහ සහතික කරන ලද (අයිතිය තහවුරු කිරීම සඳහා ) ඔප්පුවේ පිටපතක්

සැලකිය යුතුයි:

- කරගෙන යන ස්ථානය තමා සතු ඉඩමක නොවේ නම් අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශ කරන (විරුද්ධත්වයක් නොමැතිව) එම ස්ථානයේ ඔහුගේ ව්‍යාපාරය ගෙන යාමට සහතික කරන ලද ලිපියක් එම ලිපිය ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලවා සහතික කර තිබිය යුතුය.
- මෙම ස්ථානය උකස් කර ඇති ස්ථානයක් නම් එම අදාළ ආයතනයෙන් මෙම ස්ථානය උකසට යටත්ව ඇති බවට සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම.

ඇ) සුරාබදු ආයතනයේ බාර නිලධාරියා සහ සහකාර සුරාබදු කොමසාරිස් විසින් යෝග්‍යතාවය තහවුරු කරමින් සපයන ලද වාර්තාවක්

ඈ) ඉල්ලුම්කරු විසින් දණ්ඩ නීතියකට යටත් කිසිම නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී නොමැති බව හා වෙනත් සදාචාර විරෝධී ක්‍රියාවකට ගතවූ අවුරුදු 5 ක කාලය තුළ සම්බන්ධවී නොමැති බවට දිවුරුම් පෙත්සමක්

ඉ) ලියාපදිංචි මිනුම් නිලධාරියකුගෙන් කිට්ටුම ප්‍රසිද්ධ ස්ථාන, පාසල් පූජනීය නියමිත ස්ථාන සිට දුර ප්‍රමාණය (කපුටකු පියාසර කරන සීමාව තුළ) සහතික කරන සැලැස්මක්.

ඊ) ව්‍යාපාරය ලියාපදිංචි කරනු ලැබූ සහතිකයක් සහ සංස්ථාවකින් නොතාරිස් කෙනෙකු ලැබූ කොම්පැණියක සහතිකයක්

උ) ගෙවීම් කුවිතාන්සිය (ආපසු නොගෙවන ඉල්ලුම්පතේ මුදල)

ඌ) සිල්ලරට මත්පැන් විකුණන්නන් සඳහා, පොදු වෙළඳ සල්, සිල්ලර කඩ වල බලය පැවරීමට රජයේ පිළිගත් විගනන ආයතනයක් මගින් හෝ ආදායම් පරිපාලන දෙපාර්තමේන්තුව මගින්, අදාල ඉල්ලුම් කළ

ආයතනය පසුගිය අවුරුද්ද වෙනුවෙන් රුපියල් මිලියන 72 කට වැඩි මුදලක ආදායමක් ඇති බවට තහවුරු කළ වාර්ථාවක්.

එ) තැබෑරුම් බලපත්‍ර ඉල්ලුම්පත් සඳහා ඉල්ලුම්කරු විසින් ඉහත සඳහන් ලියකියවිලි වලට අමතරව පහත සඳහන් වාර්තාද ලියකියවිලිද අවශ්‍ය වේ.

1. 1975 අංක 17 දරන සමාජ ශාලා පනත යටතේ ලියාපදිංචි කළ බවට සහතිකය
2. ඉල්ලුම්කල දිනට පෙර අවුරුදු 5 ක් ඇතුළත තැබෑරුම දිගටම පැවැත්වූ බව ඔප්පු කිරීමට ලියකියවිලි (දැනට බලපත්‍ර ඇති අයට මෙය අදාළ නොවේ)
3. බැංකු ගිණුමක් ඇති බවට සහතිකයක්.
4. ක්‍රීඩා අමාත්‍යාංශය මගින් හෝ සමාජ සේවා අමාත්‍යාංශය වෙතින් ලබාගත් ලියාපදිංචි බව ඔප්පු කරන සහතිකයක්

ඒ) අයදුම් කළ දිනට පෙර ආදායම් බදු හෝ වෙනත් අය බදු සහ මාසික ගෙවීම් කරන බවට ඔප්පු කිරීමක්

ඔ) බීර,වයින් හා සටවීටි විකිණීමේ බලපත් සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. ආ),ඇ),ඈ),ඉ),උ),ඌ) ඡේදවල සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**3 ඉල්ලුම් පත ඉදිරිපත් කිරීම**

- සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් සහකාර සුරාබදු කොමසාරිස් තුමාගේ ලිපිනයට ලියා ලියාපදිංචි තැපෑලෙන් සහකාර සුරාබදු කොමසාරිස්ගේ කාර්යාලයට යැවිය යුතුය.
- ප්‍රධාන සුරා බදු කොමසාරින් තුමා / සහකාර සුරාබදු කොමසාරිස් තුමාගෙන් අනුමත කරන ලද ලිපිය ලැබුණු පසු ඔහු ඇය අනුමත කරන ලද ලිපිය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කොට බලපත්‍රය ලබාගත යුතුය.

සැලකිය යුතුයි:
ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

**ඉල්ලුම් පත්‍ර පෝරම**

| ඉල්ලුම් පත්‍ර අංකය / නම | විස්තර |
|---|---|
| මත්පැන් සඳහා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පත්‍රය | මත්පැන් සඳහා අළුත් බල පත්‍රයක් ලබා ගැනීම (ඉල්ලුම් පත්‍රයක් ලබාගත යුත්තේ සුරා බදු මූලස්ථානයෙන් හෝ සහකාර සුරාබදු කොමසාරිස් කාර්යලයෙන්) |

**පියවරෙන් පියවර ක්‍රියාවලිය**

පියවර 1: ඉල්ලුම්කරු විසින් සුරා බදු මූලස්ථානයෙන් හෝ දිවයිනටම බලපන සහකාර සුරා බදු කොමසාරිස් කාර්යාලයකින් මුදල් ගෙවා ඉල්ලුම් පතක් ලබාගත යුතුය.

පියවර 2: සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පතක් සහකාර සුරාබදු කොමසාරිස් තුමාගේ ලිපිනයට ලියා ලියාපදිංචි තැපෑලෙන් පළාත් බද සහකාර සුරා බදු කොමසාරිස්ගේ කාර්යාලයට යැවිය යුතුය.

සැලකිය යුතුය

ඉල්ලුම්පත අවශ්‍ය ලියකියවිලි සහිතව සෑම අංශයකින්ම සම්පූර්ණ විය යුතුය.

ඉල්ලුම්පත ලැබීමෙන් පසු සුරා බදු දෙපාර්තමේන්තුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙම ස්ථානයට ගොස් සෝදිසි කොට ග්‍රාම නිලධාරිගේ සහතිකයන් සමඟ වාර්තාවක් සැලසිය යුතුය.

පියවර 3: ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්තාව අනුව සුරා බදු කොමසාරිස් / පළාතේ සහකාර සුරා බදු කොමසාරිස් ඉල්ලුම්කරුට ඔවුන්ගේ තීරණය දැනුම් දේ.

පියවර 4: ඉල්ලුම්කරු අදාළ ප්‍රාදේශීය ලේකම් කර්යාලයට ගොස් සුරා බදු කොමසාරිස් /පළාතේ සහකාර සුරා බදු කොමසාරිස් විසින් අනුමත කරන ලද ලිපිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බාර දෙයි.

පියවර 5: අදාළ ප්‍රාදේශීය සභාව අනුමත කරන ලද ලිපිය පරීක්ෂා කොට අදාළ මුදල් ගෙවීමෙන් පසු බලපත්‍රය ලබාදේ.

සටහන 1:සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර හෝ ඉදිරිපත් නොකළ අයදුම්පත් අවශ්‍ය ලිපි ලේඛණ උපදේශකගේ අනුමැතිය නොලත් අයදුම්පත්‍ර අවලංගු වේ. මධ්‍යසාර විකිණීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය නොලැබුව හොත් එසේ වීමට හේතු දක්වා තැපැලෙන් එවනු ඇත. ඒ සමඟම බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් දන්වා ඇත. අයදුම්කරු උපකාරක ලිපියක් සමඟ තමාගේ අයදුම් පත්‍ර නිෂ්ප්‍රභා වීමට හේතූන් සමඟ සුරාබදු කොමසාරිස් තුමා වෙත ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතුය. අයදුම්කරුගේ අභියාචනය සඳහා සුරා බදු කොමාසරිස්ගේ තීරණය දන්වා ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබේ.

සටහන 2: සුරාබදු දෙපාර්තමේන්තුවේ අනුමැතිය මධ්‍යසාර විකිණීමේ බලපත්‍රය සඳහා අවශ්‍ය වේ.

**කාලසීමාව**

**ක්‍රියාවලියේ කාලසීමාව**
අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දිනක් ඇතුළතදී බලපත්‍රය නිකුත් කෙරේ.

**භාරදීමේ කාලසීමාව**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන ඕනෑම වේලාවකදී

**වලංගු කාලසීමාව**
අවුරුදු එකයි
සැ.ක - සෑම වසරකදීම බලපත්‍රය අළුත්කළ යුතුවේ

**වැඩ කරන කාලය / දින**
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (සංස්ථාගත අංශය)
පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා

**අවශ්‍ය අමතර ලියකියවිලි**

අ) ප්‍රාදේශීය අධිකාරිය මගින් සහතික කරනු ලැබූ යෝජිත ගොඩනැගිල්ලේ සැලැස්මේ පිටපතක්.
ආ) ඔප්පුව සහ සහතික කරන ලද (අයිතිය තහවුරු කිරීම සඳහා ) ඔප්පුවේ පිටපතක්

සැලකිය යුතුයි:

- කරගෙන යන ස්ථානය තමා සතු ඉඩමක නොවේ නම් අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශ කරන (විරුද්ධත්වයක් නොමැතිව) එම ස්ථානයේ ඔහුගේ ව්‍යාපාරය ගෙන යාමට සහතික කරන ලද ලිපියක් එම ලිපිය ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලවා සහතික කර තිබිය යුතුය.
- මෙම ස්ථානය උකස් කර ඇති ස්ථානයක් නම් එම අදාළ ආයතනයෙන් මෙම ස්ථානය උකසට යටත්ව ඇති බවට සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම.

ඇ) සුරාබදු ආයතනයේ බාර නිලධාරියා සහ සහකාර සුරාබදු කොමසාරිස් විසින් යෝග්‍යතාවය තහවුරු කරමින් සපයන ලද වාර්තාවක්

ඈ) ඉල්ලුම්කරු විසින් දණ්ඩ නීතියකට යටත් කිසිම නීති විරෝධි ක්‍රියාවකට සම්බන්ධ වී නොමැති බව හා වෙනත් සදාචාර විරෝධී ක්‍රියාවකට ගතවූ අවුරුදු 5 ක කාලය තුළ සම්බන්ධවී නොමැති බවට දිවුරුම් පෙත්සමක්

ඉ) ලියාපදිංචි මිනුම් නිලධාරියකුගෙන් කිට්ටුම ප්‍රසිද්ධ ස්ථාන, පාසල් පූජනීය නියමිත ස්ථාන සිට දුර ප්‍රමාණය (කපුටකු පියාසර කරන සීමාව තුළ) සහතික කරන සැලැස්ම

ඊ) ව්‍යාපාරය ලියාපදිංචි කරනු ලැබූ සහතිකයක් සහ සංස්ථාවකින් නොතාරිස් කෙනෙකු ලැබූ කොම්පැනියක සහතිකයක්

උ) ගෙවීම් කුවිතාන්සිය (ආපසු නොගෙවන ඉල්ලුම්පතේ මුදල)

ඌ) සිල්ලරට මත්පැන් විකුණන්නන් සඳහා, පොදු වෙළඳ සල්, සිල්ලර කඩ වල බලය පැවරීමට රජයේ පිළිගත් විගනන ආයතනයක් මගින් හෝ ආදායම් පරිපාලන දෙපාර්තමේන්තුව මගින්, අදාල ඉල්ලුම් කළ ආයතනය පසුගිය අවුරුද්ද වෙනුවෙන් රුපියල් මිලියන 72 කට වැඩි මුදලක ආදායමක් ඇති බවට තහවුරු කළ වාර්ථාවක්.

එ) තැබෑරුම් බලපත්‍ර ඉල්ලුම්පත් සඳහා ඉල්ලුම්කරු විසින් ඉහත සඳහන් ලියකියවිලි වලට අමතරව පහත සඳහන් වාර්තාද ලියකියවිලිද අවශ්‍ය වේ.

01. 1975 අංක 17 දරන සමාජ ශාලා පනත යටතේ ලියාපදිංචි කළ බවට සහතිකය
02. ඉල්ලුම්කල දිනට පෙර අවුරුදු 5 ක් ඇතුළත තැබෑරුම දිගටම පැවැත්වූ බව ඔප්පු කිරීමට ලියකියවිලි (දැනට බලපත්‍ර ඇති අයට මෙය අදාළ නොවේ)
03. බැංකු ගිණුමක් ඇති බවට සහතිකයක්.
04. ක්‍රීඩා අමාත්‍යාංශය මගින් හෝ සමාජ සේවා අමාත්‍යාංශය වෙතින් ලබාගත් ලියාපදිංචි බව ඔප්පු කරන සහතිකයක්

ඒ) අයදුම් කළ දිනට පෙර ආදායම් බදු හෝ වෙනත් අය බදු සහ මාසික ගෙවීම් කරන බවට ඔප්පු කිරීමක්

ඔ) බීර, වයින් හා සටුවටී විකිණීමෙ බලපත් සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. ආ), ඇ), ඈ), ඉ), උ), ඌ) ඡේදවල සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**සටහන**

බලපත්‍රයක් අළුත්කර ගැනීම සඳහා පහත සඳහන් ලියවිළි ඉදිරිපත් කල යුතුවේ

- ආ), ඇ), ඈ), ඉ), උ), ඌ) ඡේදවල සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.
- බලපත්‍රය අළුත්කරන දින සිට වසර 3 කට පෙර කාළය තුල කිසිඳු නීත විරෝධී කටයුත්තක් සිදු නොවූ බවට නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් වරයා විසින් සපයන ලද වාර්ථාවක්

**සේවය සඳහා වගකීම**

| පුද්ගලයාගේ තරාතිරම | අංශයේ නම |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් තුමා | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| ප්‍රධාන ලිපිකරු | සංස්ථාගත අංශය / අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

**විශේෂ කරුණු**

බලපත්‍රයක් පැවරීම සහ ස්ථානමාරු කිරීම සුරා බදු දෙපාර්තමේන්තුව මගින් කරනු ලැබේ.

**ආයතනයේ තොරතුරු**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යක්කලමුල්ල.

දුරකථන : 091-2286132
ෆැක්ස් අංක : 091-2286038
විද්‍යුත් තැපැල : ds@yakkalamulla.ds.gov.lk
වෙබ් අඩවිය : www.yakkalamulla.ds.gov.lk